17 හැවිරිදි හෝ ඊට ආසන්න වයසක පසුවන ශිෂ්‍යාවකට ගුරුවරයෙකු විසින් ලිංගික අතවරයක් සිදුකළ බවට කියැවෙන සිදුවීමකට පසුගිය දිනවල බොහෝ මාධ්‍ය තුළ ප්‍රමුඛ අවධානයක් ලැබී තිබිණි. කෙසේ නමුත්, එම සෑම පුවත් වාර්තාවක්ම, සෑම ලිපියක්ම මනා ආචාර ධාර්මික ප්‍රවේශයකින් ඉදිරිපත් වී තිබුණේද යන්න සැකයකි.

උදාහරණයක් ලෙසින් දිවයින සහ මව්බිම පුවත්පත් කතුවැකි (07/26) දැක්විය හැක. මෙම කතුවැකි දෙක සම්බන්ධයෙන් මින් පෙරද අප වෙනත් ප්‍රවේශයකින් ප්‍රශ්න කොට ඇත.

මෙම කතුවැකි දෙකම තුළ අදාළ සැකකරුවාව "ගුරා" යනුවෙන් හඳුන්වනු ලබයි. එසේම මව්බිම කතුවැකිය තුළ එසේ ගුරා යනුවෙන් වැහැරීම සාධාරණීකරණය කරන්නේ, ගුරු වෘත්තියේ යෙදී සිටිනා අනෙක් අය සහ ගුරු වෘත්තියේ යෙදී සිටියදී සැකකරුවෙකු වන මෙවැනි අයෙකු අතර වෙනසක් දැක්වීමට එසේ භාවිතා කළ යුතු යැයි පවසමිනි.

කෙසේ නමුත් අප මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණු දෙකකි. එකක් නම්, සමාජයේ චින්තනය හැඩගැස්වීමට භාෂාවේ ඇති ප්‍රබල බලපෑමත්, එම භාෂාව සමාජගත කිරීමට මාධ්‍ය මගින් ලබාදෙන දායකත්වයත් වේ. එහිදී ගුරා වැනි යෙදුම් ඔස්සේ හෑල්ලු වන්නේ එම සැකකරු නොව සමස්ත ගුරු වෘත්තියම නොවේදැයි පාඨකයින් ලෙසින් අප විමසිය යුතුයි.

දෙවෙනුව, නීතිය ඉදිරිපිටට සැකකරුවෙකු ලෙසින් පැමිණවූ අයෙකු පිළිබඳව නීතියෙන් තීන්දුවක් ලබාදීම පෙරාතුව, මාධ්‍ය ඔස්සේ වරදකරු ලෙසින් තීන්දු කිරීම කෙතරම් යුක්තියුක්තද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මෙම සිදුවීමට අදාළව අප මින් පෙර ඉදිරිපත් කළ පෝස්ටුවට ප්‍රවේශය: **https://www.facebook.com/ethicseye/posts/1476655652689487**

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima**